## සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### නොවැම්බර් 01 වන සතිය - බුද්ධ ධර්මය - 1 ශ්‍රේණිය

සැකසුම - ජේ.ඒ.ඩී. කෞශල්‍යා - ර/බළ/රංවල මහ විද්‍යාලය

**පුංචි දුවේ පුතේ, අම්මට හරි තාත්තට හරි එක්ක එකතු වෙලා පෙළ පොතේ පාඩම් ටික කියවන්න.මේ ප්‍රශ්න ටික අහන්න කියන්න.ඔයගොල්ලො උත්තර කියනන්න.**

1. බුදුන් වහන්සේ පිරිනිවන් පෑවේ කුමන පොහොය දිනකදීද?
2. දේවානම්පියතිස්ස රජතුමා කළ යහපත් වැඩ 2ක් කියන්න.
3. බුද්ධං සරණං ගච්ඡාමි යන්නෙහි තේරුම කුමක් ද?
4. ඔබ දුටු පෙරහැරක් අඳින්න.

5. අපි නරක වචන කතා කළා ම උපදින්නේ කොහේ ද/
6. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලංකාවට වැඩම කළ තෙරණින් වහන්සේ කවුද?
7. රුවන්මැලි සෑය තිබෙන්නේ කොහේද?
8. ඔබේ පන්සලේ ඔබ දුටු වෙහෙර වහන්සේ ඇඳ පාට කරන්න.
9. බෞද්ධකොඩියේ වර්ණ කීයද? ඒ මොනවාද?
10. පහත කවි තාලයට ගායනා කරමු.කවිවලින් කියවෙන්නේ කවුරු ගැනද?

මෙත් සිසිලෙන් සිත පුරවා
වැලි දෝතක් ගෙන උඩදා
වැලි කැට ගණනට සැමදා
වැඩිහිටි ඔවදන් පැතුවා

රාහුල සමිදුගේ මුහුණේ
ප්‍රිය බව නිතර ම රැඳුණේ
ශික්ෂාවෙන් අග තැන්පත්
තනතුර සමිඳුට ලැබුණේ

සැම දෙනාම පරිස්සමට ගෙදර ඉන්න. බුදු සරණයි !